ජංගම බැංකු සේවාව - NEOS Pay පහසුකම

නියම හා කොන්දේසි

1. අර්ථ නිරූපණය-

1.1 "ගිණුම (ගිණුම්)" යන්නෙන්, ජංගම බැංකු සේවා භාවිතයෙන් මෙහෙයුම් සිදුකිරීම සඳහා සුදුසුකම් ලබන ගිණුමක් (ගිණුම්) වන්නා වූ ගනුදෙනුකරුගේ බැංකු ගිණුම (ගිණුම්) සහ/හෝ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම සහ/හෝ වෙනත් වර්ගයක ගිණුමක් (ගිණුම්) අදහස් වේ.

1.2 "බැංකුව" යන්නෙන්, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය සහ එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් අදහස් වේ.

1.3 "ජෛවමිතික දත්ත" යන්නෙන්, ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමේදී ගනුදෙනුකරු විසින් ඔහුගේ/ඇයගේ තේරීම මත භාවිත කරනු ලැබිය හැකි මුහුණු අනන්‍යතාවය සහ ඇඟිලි සළකුණු අනන්‍යතාවය අදහස් වේ.

1.4 "ගනුදෙනුකරු" යන්නෙන්, ගනුදෙනු සිදුකිරීම සඳහා බැංකුව විසින් සපයා ඇති ජංගම බැංකු සේවා භාවිත කරන්නා වූ තනි පුද්ගලයකු අදහස් වේ.

1.5 "Just Pay පහසුකම" යන්නෙන්, ස්මාට් ජංගම උපාංග භාවිත කර ස්වකීය ජංගම හෝ ඉතුරුම් ගිණුමෙන් වෙළෙන්දාගේ ගිණුමකට සෘජුව මුදල් මාරු කිරීම මගින් සිල්ලර ගෙවීම් සිදුකිරීමට ගනුදෙනුකරුවන්ට පහසුකම් සලස්වන්නා වූ Lanka Pay හි පවත්නා ගෙවීම් පහසුකමක් අදහස් වේ.

1.6 "NEOS Pay" යන්නෙන්, ජංගම බැංකු සේවා යෙදුම වෙත ලියාපදිංචි වීමෙන් Just Pay පහසුකම හරහා වෙළඳ ගෙවීම් සිදුකිරීම සඳහා ගනුදෙනුකරුවන් විසින් භාවිත කරනු ලැබිය හැකි QR කේතය පදනම් කරගත් ගෙවීමේ ක්‍රමවේදයක් අදහස් වේ.

1.7 "වෙළෙන්දා" යන්නෙන්, ව්‍යාපාරයක හෝ වෙළඳාමෙහි නිරත ව සිටින යම් තැනැත්තකු අදහස් වේ.

1.8 "ජංගම බැංකු සේවාව" යන්නෙන්, බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ජංගම උපාංගයක් හරහා පරිශීලක නාමයක් සහ මුරපදයක් භාවිතයෙන් බැංකු ගනුදෙනු සත්‍ය

බව තහවුරු කරගැනීම සහ/හෝ බැංකු ගනුදෙනු සිදුකිරීම අදහස් වේ. මෙයට NEOS Pay පහසුකම ඇතුළත් වේ.

1.9 “ජංගම බැංකු සේවා යෙදුම” යන්නෙන්, ජංගම උපාංගයක් හරහා ගනුදෙනු සිදුකිරීමේ යෙදීමේ කාර්යය සඳහා බැංකුව විසින් ලබාදී ඇති යෙදුමක් අදහස් වේ.

1.10 “ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමේ සේවාව” යන්නෙන්, බැංකුවේ ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීම සඳහා ගනුදෙනුකරුගේ අනන්‍යතාවය තහවුරු කරගැනීමට පිණිස වන ආරක්ෂණ කේතයක් වශයෙන්, ගනුදෙනුකරුට, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී මාර්ගගත/ ජංගම බැංකු සේවා මුරපදය වෙනුවට, අවසරලත් ජංගම උපාංගයක ලියාපදිංචි කර ඇති ගනුදෙනුකරුගේ මුහුණ හඳුනාගැනීම හෝ ඇඟිලි සළකුණ භාවිත කළ හැකි වන්නා වූ සේවාවක් අදහස් වේ.

1.12 “මුරපදය” යන්නෙන්, ලියාපදිංචි වන අවස්ථාවේ දී ගනුදෙනුකරු විසින් මුලින්ම ඇතුලත් කරනු ලබන හෝ ගනුදෙනුකරු විසින් පසුව සකස් කරනු ලබන මුරපදය අදහස් වේ.

1.13 “Pay Someone” යන්නෙන්, ගිණුම් අංකය වෙනුවට ප්‍රතිලාභියාගේ ලියාපදිංචි ජංගම දුරකතන අංකය ඇතුළත් කිරීමෙන් හෝ ප්‍රතිලාභියාගේ QR කේතය පරිලෝකනය කිරීමෙන් වෙනත් ගනුදෙනුකරුවකු වෙත මුදල් මාරු කිරීම සඳහා ගනුදෙනුකරුවකු වෙත ජංගම බැංකු සේවා යෙදුම තුළ සපයා දී ඇති විශේෂාංගයක් අදහස් වේ.

1.14 “QR කේතය” යන්නෙන්, ක්ෂණික ප්‍රතිචාර කේතය අදහස් වේ.

1.15 “සේවා සැපයුම්කරු” යන්නෙන්, විදුලි සංදේශ සැපයුම්කරුවන්, රක්ෂණ සමාගම්, ජල සැපයුම් සමාගම් සහ විදුලි සැපයුම් සමාගම් ආදිය වැනි යම් තුන්වන පාර්ශ්වයේ උපයෝගීතා සැපයුම්කරුවකු අදහස් වේ.

1.16 “අහඹු සංඛ්‍යාව” යන්නෙන්, ගනුදෙනුකරු වෙනත් මූල්‍ය ආයතනයක ලියාපදිංචි කර ඇති ජංගම දුරකතන අංකය වෙත එම වෙනත් මූල්‍ය ආයතනය විසින් ජංගම බැංකු සේවා යෙදුමේ කාර්ය සඳහා ගනුදෙනුකරුගේ සත්‍ය බව තහවුරු කර ගැනීම පිණිස යවනු ලබන අහඹු මුදල් අගයක් අදහස් වේ.

1.16 “පරිශීලක අනන්‍යතාවය (User ID)” යන්නෙන්, ගනුදෙනුකරුගේ විශේෂ පරිශීලක හඳුනාගැනීම අදහස් වේ.

2. ලියාපදිංචි වීම

2.1 ගනුදෙනුකරු විසින් ඔහුගේ/ඇයගේ ජංගම උපාංගය හරහා ජංගම බැංකු සේවා යෙදුම බාගත කරගැනීමෙන් පසුව, බාගත කරන ලද ජංගම බැංකු සේවා යෙදුමෙහි Just Pay පහසුකම සක්‍රීය කර ඇති යම් මූල්‍ය ආයතනයක පවත්වාගෙන යනු ලබන ඔහුගේ/ඇයගේ යම් ගිණුමක තෝරාගත් ගිණුම් අංකය ඇතුළත් කිරීමෙන් ගනුදෙනුකරුට ජංගම බැංකු සේවා යෙදුම සඳහා ලියාපදිංචි විය හැකි ය. වර්තමාන නියාමන අවශ්‍යතාවයන්ට අනුව, ජංගම බැංකු සේවා යෙදුම බාගත කර ගැනීමට සහ එය ක්‍රියාත්මක කිරීමට යොදාගනු ලබන ජංගම උපාංගයේ විස්තර ජංගම බැංකු සේවා යෙදුමේ ප්‍රයෝජනය සඳහා ඔහුගේ/ඇයගේ ගනුදෙනුකාර ප්‍රොෆයිලය හෝ පරිශීලක අනන්‍යතාවය යටතේ ස්වයංක්‍රීයවම ලියාපදිංචි වන බව ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගනු ලැබේ;

වෙනත් මූල්‍ය ආයතනවල ගනුදෙනුකරුවන් සඳහා අහඹු සංඛ්‍යාවක් උත්පාදනය වනු ඇත. එකී අහඹු සංඛ්‍යාව ඇතුළත් කිරීමෙන් පසුව ගනුදෙනුකරුට NEOS Pay පහසුකම සඳහා ලියාපදිංචි විය හැකි ය.

(සැක දුරු කිරීම සඳහා, අහඹු සංඛ්‍යාව, වෙනත් මූල්‍ය ආයතනවල පවත්වාගෙන යනු ලබන ගිණුම් සඳහා උත්පාදනය වනු ඇත.)

ගනුදෙනුකරු විසින් වෙනත් මූල්‍ය ආයතනවල පවත්වාගෙන යනු ලබන ගිණුම සඳහා ලියාපදිංචි වීම පිණිස අහඹු සංඛ්‍යාව නිවැරදිව ඇතුළත් කිරීම සම්බන්ධයෙන් තමා වගකිව යුතු වන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

3. ජංගම බැංකු සේවාව හරහා ගනුදෙනු පිළිබඳ උපදෙස් සහ පණිවුඩ ලබාදීම

3.1 ගනුදෙනුකරු විසින් ඔහුගේ/ඇයගේ ස්වකීය අභිමතය පරිදි තීරණය කරනු ලැබිය හැකි ආකාරයට, මුරපදය ඇතුළත් කිරීම මගින් හෝ ජෛවමිතික ක්‍රමයක් මගින් හෝ ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමට (Login) අවසර තිබේ.

3.2 ජංගම බැංකු සේවා යෙදුම හරහා ලැබෙන සියලු උපදෙස් හෝ පණිවුඩ පිළිගැනීමට හෝ ඒ අනුව කටයුතු කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

3.3 ගනුදෙනුවක් සිදුකිරීම සඳහා අවශ්‍ය වන ගනුදෙනුකරුගේ විස්තර යම් තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නකු සමඟ බෙදා ගැනීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

3.4 බැංකුව විසින් කිසිදු අවස්ථාවකදී සන්නිවේදන කටයුතු සඳහා විද්‍යුත් තැපැල් ලිපි හුවමාරු කිරීම හෝ ගනුදෙනුකරුගේ පරිශීලක අනන්‍යතාවය(User ID) හෝ මුරපදය ඉල්ලා සිටීම සිදු නොකරනු ඇති බව ගනුදෙනුකරු විසින් මෙයින් අවබෝධ කරගනු ලැබේ.

3.5 ජංගම බැංකු සේවාවේ පවතින විශේෂිත මෙනු තෝරා ගැනීම් භාවිත කිරීම තුළින් ජංගම බැංකු සේවා මහෙයුම් සිදුකිරීමට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබිය යුතු ය.

3.6 ජංගම බැංකු සේවා සඳහා ලියාපදිංචි වීම සහ ජංගම බැංකු සේවාව හරහා ගනුදෙනු සිදුකිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් බැංකුව වෙත නිරවද්‍ය සහ සම්පූර්ණ තොරතුරු සැපයීමට ගනුදෙනුකරු විසින් බාරගනු ලැබිය යුතු ය. ගනුදෙනුකරු දැනුවත් වන්නා වූ යම් දෝෂයක්, විෂමතාවක් හෝ මඟහැරීමක් පිළිබඳව ගනුදෙනුකරු විසින් වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

3.7 ජංගම බැංකු සේවාව හරහා හුවමාරු වන ඉලෙක්ට්‍රොනික පණිවුඩ ගනුදෙනුකරු සම්බන්ධයෙන් අවසානාත්මක වන අතර එමගින් ගනුදෙනුකරු බැඳී සිටිය යුතු බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය.

3.8 කවර ආකාරයකින් බලාත්මක වුවද, ජංගම බැංකු සේවාව භාවිතයෙන් සිදුකරනු ලබන හෝ බලාත්මක කරනු ලබන සියලු ගනුදෙනු සම්බන්ධයෙන් පූර්ණ වගකීම ගනුදෙනුකරු විසින් භාරගනු ලැබිය යුතු ය.

3.9 ජංගම බැංකු සේවා සඳහා ලියාපදිංචිවීමෙන් පසුව, ගනුදෙනුකරු විසින් පවත්වාගෙන යනු ලබන නම් කළ ගිණුම් ජංගම බැංකු සේවා යෙදුමට සම්බන්ධ වනු ඇති බව ඔහු විසින් පිළිගනු ලැබේ. එසේ වුවද, ගනුදෙනුකරු බද්ධ ගිණුම් හිමියකු වන්නා වූ බද්ධ ගිණුම් සම්බන්ධයෙන් වන විටදී, "ඕනෑම අයෙකුට අත්සන් කළ හැකි ය" "(anyone to sign)" යන මෙහෙයුම් උපදෙස සහිත ගිණුම් සඳහා පමණක් ජංගම බැංකු සේවාව මගින් ගනුදෙනු සිදු කරනු ලැබේ. වෙනත් යම් ආකාරයක උපදෙස් සහිත බද්ධ ගිණුම්වල ශේෂය පරීක්ෂා කිරීම පමණක් සිදු කළ හැකි වනු ඇත.

3.10 ගනුදෙනුකරුගේ නම්කළ ගිණුමේ (ගිණුම්වල) ප්‍රමාණවත් මුදල් පවතින්නේ නම් මිස, ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවාව හරහා ගනුදෙනු සිදුකිරීමට උත්සහ නොකළ යුතු ය.

3.12 බැංකුවේ නිලධරයකු/නිලධරයන් විසින් බලය ලබාදීමක් සිදුකිරීමට අවශ්‍ය වන්නා වූ ගනුදෙනුකරුගේ ඉල්ලීම්/උපදෙස් වහාම හෝ ස්වයංක්‍රීයව බලාත්මක නොවන බවට සහ ගනුදෙනුකරු වෙත දැන්වීමෙන් හෝ දැන්වීමෙන් තොරව ස්වකීය පරම අභිමතය පරිදි එම උපදෙස් සඳහා අවසර ලබාදීම හෝ අවසර ලබා නොදී සිටීම සඳහා බැංකුවට අයිතිය ඇති බවට ගනුදෙනුකරු එකඟව සිටිය යුතු ය.

3.13 බද්ධ ගිණුමක් (ගිණුම්) සම්බන්ධයෙන් වන විටදී, ජංගම බැංකු සේවාව භාවිතයෙන් හටගන්නා වූ සියලු ගනුදෙනු සඳහා සෑම ගිණුම් හිමියකුම එක්ව සහ වෙන් වෙන්ව වගකිව යුතු වන්නේ ය.

3.14 ගනුදෙනුකරු වෙනුවෙන් ගෙවීමක් සිදුකිරීමේ දී, බැංකුව, ගනුදෙනුකරුගේ නියෝජිතයකු වශයෙන් හෝ ගෙවීම ලබන්නා වූ තුන්වන පාර්ශ්වයේ නියෝජිතයකු වශයෙන් හෝ ක්‍රියා නොකරන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

3.15 කවර හෝ ක්‍රමයක් භාවිතයෙන්, ජංගම බැංකු සේවාව හරහා ගනුදෙනුකරු විසින් සිදු කරන ලද පරිශීලක ක්‍රියාකාරකම් සහ ගනුදෙනු පිළිබඳ සටහන් පවත්වාගෙන යාමට සහ යම් නිශ්චිත ගනුදෙනුවක්/ක්‍රියාකාරකමක් පරිශීලක අනන්‍යතාව (User ID) සහ මුරපදය භාවිතයෙන් සිදු කරන ලද බව තහවුරු කිරීමේ හෝ එය සත්‍ය බව සහතික කිරීමේ කාර්ය සඳහා එම වාර්තා භාවිත කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

3.16 රතු නිවේදන ගෙවීම් පියවීම වැනි හදිසි ගෙවීම් පියවීම සඳහා ජංගම බැංකු සේවාව භාවිත කළ නොහැකි බවට ගනුදෙනුකරු විසින් මෙයින් එකඟව සිටිය යුතු අතර එම ගෙවීම් බැංකු ශාඛාවකින් සිදු කරනු ලැබිය යුතු ය.

3.17 සියලු කාර්ය සඳහා, ජංගම බැංකු සේවාව හරහා සිදුකරන ලද සියලු ගනුදෙනු පිළිබඳ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශ ගනුදෙනුකරු සම්බන්ධයෙන් අවසානාත්මක සහ එමගින් ගනුදෙනුකරු බැඳී සිටින බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය.

3.18 ප.ව. 9 න් පසුව ජංගම බැංකු සේවාව හරහා හෝ වෙනත් යම් මාර්ගයකින් සිදු කරනු ලබන ගනුදෙනුවල වලංගු දිනය එදිනට පසුව එළඹෙන දිනය වන බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය.

4. ගනුදෙනුවල සුරක්ෂිතභාවය

4.1 ගනුදෙනුකරු විසින්, ජංගම බැංකු සේවාව භාවිතා කිරීම සඳහා අවශ්‍ය වන යම් උපාංගයක් ජංගම බැංකු සේවාව වෙත ඇතිවිය හැකි හානිකර තර්ජනවලට එරෙහි ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සහිතව නිසි පරිදි ක්‍රියාකරන තත්ත්වයකින් සපයාගෙන පවත්වාගෙන යාමට එකඟව සිටින අතර ජංගම බැංකු සේවාව වෙත ප්‍රවේශ වීම සඳහා දෝෂ සහිත, අසම්පූර්ණ හෝ අනාරක්ෂිත උපාංග සහ/හෝ මෘදුකාංග භාවිත කිරීම හෝ ජංගම බැංකු සේවාව බැංකුව වෙත හානිදායක වන යම් ආකාරයකින් භාවිත කිරිම නොකර සිටීමට ගනුදෙනුකරු විසින් භාරගෙන සිටිනු ලැබේ.

4.2 ජෛවමිතික දත්ත මගින් හෝ පරිශීලක අනන්‍යතාවයක් (User ID) සහ මුරපදයක් භාවිතයෙන් යන ආකාර දෙකෙන් කවර හෝ ආකාරයකින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ විය හැකි බව ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගෙන ඊට එකඟව සිටිනු ලැබේ.

4.3 ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබාදීමෙන්, එම උපාංගයේම ජෛවමිතික දත්ත ලියාපදිංචි කර ඇති යම් තුන්වන පාර්ශ්වයකට ද ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබාදෙන බවට ගනුදෙනුකරු විසින් තවදුරටත් එකඟව සිට ඒ බව අවබෝධ කරගෙන සිටිනු ලැබේ.

4.4 ගනුදෙනුකරු පරිශීලක අනන්‍යතාවයක් (User ID) සහ මුරපදයක් මගින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමට තෝරා ගන්න අවස්ථාවක දී, ජංගම බැංකු සේවා යෙදුම වෙත මුල්ම වරට ප්‍රවේශ වීමෙන් පසුව වහාම සහ ඉන්පසුව නියමිත කාල අන්තරවල දී මුරපදය වෙනස් කිරීමට ගනුදෙනුකරු මෙයින් එකඟව සිටිනු ලැබේ.

4.5 (ගනුදෙනුවලට අදාළ සියලු දත්ත සහ තොරතුරු ඇතුළුව) ජංගම බැංකු සේවාව යම් අනවසර තැනැත්තකු/තැනැත්තන් වෙත නිරාවරණය වීමෙන් හෝ එවැනි තැනැත්තකු ජංගම බැංකු සේවාව වෙත ප්‍රවේශවීමෙන් හෝ එය භාවිත කිරීමෙන් ආරක්ෂා කරගැනීම සඳහා ගනුදෙනුකරු විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග සකස් කර පවත්වාගෙන යා යුතු ය.

4.6 කිසිවකු හෝ විසින් පරිශීලක අනන්‍යතාවය සහ මුරපදය අනවසරයෙන් භාවිත කිරීමක් හෝ භාවිත කිරීමට තැත් කිරීමක් පිළිබඳව හෝ යම් තුන්වන පාර්ශ්වයක ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුම වෙත අනවසරයෙන් ප්‍රවේශ වීමක් හෝ එසේ ප්‍රවේශ වීමට තැත්කිරීමක් පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් වන්නේ නම්, ගනුදෙනුකරු විසින් වහාම ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

4.7 ජංගම බැංකු සේවා යෙදුමේ පරිශීලක අනන්‍යතාවය (User ID) සහ මුරපදය දැඩි රහස්‍යභාවයකින් යුතුව තබා ගැනීමටත් කිසිදු අවස්ථාවක දී කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ එය යම් තැනැත්තකු වෙත හෙළිදරව් කිරීම හෝ යම් තැනැත්තකුට එය පරිශීලනය කිරීමට අවස්ථාවක් සැලසීම නොකර සිටීමටත් ගනුදෙනුකරු විසින් මෙයින් භාරගෙන සිටිනු ලැබේ.

5. ජෛවමිතිකදත්ත භාවිතය

5.1 ගනුදෙනුකරුගේ ජෛවමිතික දත්ත උපාංගයේ ලියාපදිංචි කට ඇත්තේ නම් පමණක් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීම සඳහා ජෛවමිතික දත්ත භාවිත කිරීමට අවසර දෙනු ලබන

බවට ගනුදෙනුකරු විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ. ඒ අනුව උපාංගයේ ජෛවමිතික දත්ත ලියාපදිංචි කර ඇති එකම තැනැත්තා ගනුදෙනුකරු පමණක් වන බව ගනුදෙනුකරු විසින් සහතික කර ගත යුතුය.

5.2 ගනුදෙනුකරුගේ ජංගම උපාංගයේ ගබඩා කර ඇති ජෛවමිතික දත්තමය තොරතුරු ඔහුගේම/ඇයගේම තොරතුරු වන බවටද, යම් තුන්වන පාර්ශවයක ජෛවමිතික දත්ත ගනුදෙනුකරුගේ ජංගම උපාංගයේ ගබඩා කර නොමැති බවටද, ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමට ඔහුගේම/ඇයගේම ජෛවමිතික දත්තමය තොරතුරු පමණක් භාවිතා කරන බවටද ගනුදෙනුකරු විසින් සහතික විය යුතුය.

ජංගම බැංකු යෙදුම සඳහා ලියාපදිංචි වී ඇති උපාංගයේ තුන්වන පාර්ශ්වයක ජෛවමිතික දත්ත ගබඩා කිරීම ආශ්‍රිතව ඇතිවන අවදානම් පිළිබඳව සහ ඒ හේතුවෙන් ගනුදෙනුවල සුරක්ෂිතභාවය අවදානමට ලක්විය හැකි වීම පිළිබඳව ගනුදෙනුකරු විසින් තවදුරටත් අවබෝධ කරගෙන පිළිගෙන සිටිනු ලැබේ.

5.3 ගනුදෙනුකරුට සර්වසම වූ සහෝදරයකු හෝ සහෝදරියක සිටින්නේ නම්, සත්‍ය බව සහතික කිරීමේ කාර්ය සඳහා ගනුදෙනුකරු විසින් මුහුණ හඳුනාගැනීමේ ක්‍රමය භාවිතා නොකළ යුතු බවටත් එවැනි අවස්ථාවලදී ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීම සඳහා ජෛවමිතික දත්ත වෙනුවට මුරපදයක් භාවිතා කළ යුතු වන බවටත් ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

5.4 සත්‍ය බව සහතික කිරීමේ කාර්යය සඳහා ගනුදෙනුකරුගේ ජෛවමිතික දත්තමය තොරතුරු භාවිත කිරීමේ සුරක්ෂිතභාවය අන්‍යාකාරයකින් අවදානමට ලක්විය හැකි වන්නා වූ පරිදි, ගනුදෙනුකරුගේ ජංගම උපාංගය මගින් සපයා දී ඇති යම් විශේෂාංගයක් අක්‍රිය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම සහ/හෝ එහි ඇති එවැනි යම් සැකසුම්වලට එකඟ වීම ගනුදෙනුකරු විසින් සිදු නොකළ යුතු ය. (උදා: මුහුණ හඳුනාගැනීම සඳහා වන "attention-aware" යන විශේෂාංගය අක්‍රිය කිරීම)

5.5 ගනුදෙනුකරුගේ මුහුණ/ඇඟිලි සලකුණ හඳුනාගැනීමේ හෝ වෙනත් ආරක්ෂණ කේතයක සුරක්ෂිතභාවයට අවදානමක් ඇතිවී ඇති අවස්ථාවකදී, ගනුදෙනුකරු විසින් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු අතර එවැනි අවස්ථාවක බැංකුව විසින් පරිශීලක අනන්‍යතාවය (User ID) අක්‍රීය කරනු ලැබේ. පරිශීලක අනන්‍යතාවය (User ID) නැවත සක්‍රිය කර ගැනීමට ගනුදෙනුකරුට අවශ්‍ය වන්නේ නම්, ගනුදෙනුකරු විසින් ආසන්නතම බැංකු ශාඛාව වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

5.6 ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු යෙදුම වෙත ප්‍රවේශ වීමේ සේවාවේ කාර්ය සඳහා, ජංගම බැංකු සේවා යෙදුම විසින් ගනුදෙනුකරුගේ අවසරලත් ජංගම උපාංගයේ ලියාපදිංචි කර ඇති මුහුණු/ඇඟිලි සලකුණු හඳුනාගැනීම පරිශීලනය කරන බව ගනුදෙනුකරු විසින් පිළිගෙන ඊට එකගව සිටිනු ලබන අතර ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු යෙදුම වෙත ප්‍රවේශ වීමේ සේවාව සැලසීම සඳහා එම තොරතුරු බැංකුව විසින් පරිශීලනය කිරීම සහ භාවිත කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් සිය කැමැත්ත ලබා දිය යුතු ය.

5.7 ගනුදෙනුකරුගේ අවසරලත් ජංගම උපාංගය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගනු ලබන අතර ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු යෙදුම වෙත ප්‍රවේශ වීමේ සේවාව වෙත ප්‍රවේශ වීම සඳහා (ගනුදෙනුකරු විසින් බලය ලබා දී තිබුණ ද නැතහොත් අන්‍යාකාරයකින් වුව ද) අවසරලත් ජංගම උපාංගය භාවිත කරන සියලු ආකාරයන් සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකිව යුතු වන්නේ ය.

5.8 ජංගම බැංකු සේවා නියම හා කොන්දේසි වලට අමතරව සහ එහි වගකීමෙන් මිදීමේ ප්‍රකාශ සහ වගකීමෙන් බැහැර කිරීම් ඉවත් කිරීමෙන් තොරව, අවසරලත් ජංගම උපාංගයේ මුහුණු/ඇඟිලි සලකුණු සත්‍ය බව සහතික කිරීමේ මොඩියුලය බැංකුව විසින් සපයනු නොලබන බවට ද, යම් අවසරලත් ජංගම උපාංගයක මුහුණු/ඇඟිලි සලකුණු සත්‍ය බව සහතික කිරීමේ විශේෂාංගයේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් සහ එය උපාංගයේ නිෂ්පාදකයා විසින් ඉදිරිපත් කරන ආකාරයට ක්‍රියා කරන්නේ ද යන්න සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු පෙනී සිටීමක් හෝ වගකීම දැරීමක් සිදු නොකරන බවට ද ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගෙන සිටිනු ලැබේ.

5.9 ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු යෙදුම වෙත ප්‍රවේශ වීමේ සේවාව සියලු අවස්ථාවන්හි දී භාවිතකළ හැකි වන බවට හෝ ඕනෑම ඉලෙක්ට්‍රොනික උපකරණයක්, මෘදුකාංගයක්, යටිතල පහසුකමක් හෝ බැංකුව විසින් කලින් කලට ලබා දෙන වෙනත් ඉලෙක්ට්‍රොනික බැංකු සේවා සමඟ ක්‍රියාත්මක කළ හැකි බවට බැංකුව විසින් කියා සිටිනු හෝ වගකියනු නොලැබේ.

5.10 බැංකුව විසින් බැංකුවේ වගකීම් බැහැර කිරීම හෝ සීමාකිරීම නීතිය මඟින් වළක්වනු ලබන්නේ නම් මිස, ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු යෙදුම වෙත ප්‍රවේශ වීමේ සේවාව භාවිත කිරීම හෝ භාවිත කිරීමට තැත් කිරීම හෝ, ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු යෙදුම වෙත ප්‍රවේශ වීමේ සේවාව හරහා හෝ ඊට සම්බන්ධව සිදුවන ගනුදෙනුකරුගේ උපදෙස් ලබාදීම් හෝ යම් අනවසර ගනුදෙනු සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් දරනු ලබන යම් පාඩුවක් සඳහා බැංකුව වගකිව යුතු නොවන්නේ ය.

5.11 ජෛවමිතික දත්ත මගින් ජංගම බැංකු යෙදුම වෙත ප්‍රවේශ වීමේ සේවාව අනිසි ලෙස භාවිතය සම්බන්ධයෙන් බැංකුව විසින් දරනු ලබන සියලු පාඩු සඳහා ගනුදෙනුකරු විසින් බැංකුව හානිපූරණය කළ යුතු ය.

7. පාඩු, ප්‍රමාද වීම් ආදිය සම්බන්ධයෙන් වන වගකීම

7.1 ගනුදෙනුකරු විසින්, ගනුදෙනුකරුගේ දැනුවත්භාවය ඇතිව හෝ නොමැතිව, ගනුදෙනුකරු වෙත නිකුත් කර ඇති හෝ ගනුදෙනුකරු විසින් ආදේශ කරගෙන ඇති පරිශීලක අනන්‍යතාවයන් (User ID) සහ මුරපදය භාවිත කිරීම හේතුවෙන් දරන ලද හෝ පියවන ලද යම් පාඩුවකින් හෝ වගකීමකින් බැංකුව නිදහස් කළ යුතු ය.

7.2 කවර හෝ හේතුවක් මත ජංගම බැංකු සේවාව මගින් ලබා දී ඇති යම් උපදෙස් පිළි නොගැනීමේ සහ/හෝ පිළිනොපැදීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගනුදෙනුකරු විසින් දරන ලද හෝ විඳින ලද යම් පාඩුවක්, හානියක් හෝ වගකීමක් සමබන්ධයෙන් බැංකුව ගනුදෙනුකරු වෙත වගකියනු නොලබන්නේ ය.

7.3 තුන්වන පාර්ශ්වයන් සමඟ පවතින විකුණුම් හෝ සේවා සැපයුම් ගිවිසුම් සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවාව හරහා කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් වන විට දී, තුන්වන පාර්ශ්වයන් විසින් ඔවුන්ගේ බැඳීම් ඉටු කිරීමේදී ඔවුන්ගෙන් සිදුවන යම් අතපසුවීම්/දෝෂ සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් ගනුදෙනුකරු වෙත වගකිව යුතු නොවන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබිය යුතු ය.

7.4 යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් කරන ලද යම් ගෙවීම් පසුව එළඹෙන වැඩ කරන දිනය අවසන් වන විට යාවත්කාලීන වන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිය යුතු අතර සේවා සැපයුම්කරුගේ ප්‍රමාදයන් හේතුවෙන් යාවත්කාල කිරීම්වල සිදුවන ප්‍රමාදයන් සම්බන්ධයෙන් බැංකුව ගනුදෙනුකරු වෙත වග කියනු නොලබන්නේ ය.

7.5 ජංගම උපාංගය සහ/හෝ පුද්ගලික පරිගනකය නැතිවීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් යම් අවස්ථාවක දී හෝ කලින් කලට නඩු පවරනු ලැබිය හැකි, විඳිනු ලැබිය හැකි, දරනු ලැබිය හැකි, කරනු ලැබිය හැකි හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි වන්නා වූ (සියලු නීත්‍යානුකූල සහ වෙනත් පිරිවැය ගාස්තු සහ වියදම් ඇතුළුව) සියලු නඩු, හානි, පාඩු, පිරිවැය, වියදම්, හිමිකම් පෑම්, වගකීම් හෝ ඉල්ලීම් සම්බන්ධයෙන් අවලංගු කළ නොහැකි ලෙස ගනුදෙනුකරු විසින් බැංකුව හානිපූරණය කරනු ලැබිය යුතු ය.

8. බැංකුවේ වගකීම්

8.1 ජංගම බැංකු සේවාව හා සම්බන්ධ බැංකුවේ පද්ධති වලට, බැංකුව වෙත කලින් කලට අදාළ විය හැකි යම් නීති, රීති, නියෝග, මාර්ගෝපදේශ, චක්‍රලේඛ, ආචාරධර්ම සංග්‍රහ සහ පවත්නා වෙළඳපොළ පරිචයන් සැලකිල්ලට ගෙන පද්ධතිය ක්‍රියාකරවීමේදී ඇතිවන අවදානම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂණ සැලසුම් සහ පාලනක්‍රම ඇති බව සහතික කිරීම සඳහා බැංකුව විසින් සාධාරණ පියවර ගනු ඇති බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබේ.

8.2 ආදායම්, ලාභ හෝ ඉතිරිකිරීම්වල යම් අහිමිවීමක් ඇතුළුව එහෙත් ඊට සීමා නොවන යම් ආනුෂාංගික, වක්‍ර, විශේෂ, අනුගාමීව සිදුවන හෝ ආදර්ශ හානි සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවකදී බැංකුව හෝ යම් සේවා සැපයුම්කරුවකු විසින් ගනුදෙනුකරු වෙත වගකිවයුතු නොවන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

8.3 බැංකුවේ බරපතල නොසැලකිල්ල හෝ සිතාමතාම පැහැර හැරීම හේතුවෙන් මිස, :

(i) ගනුදෙනුකරු හෝ බලය පැවරී ඇති හෝ නොමැති වෙනත් යම් තැනැත්තකු විසින් ජංගම බැංකු සේවාව භාවිතා කිරීම සහ/හෝ එසේ භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යම් තොරතුරු වෙත ප්‍රවේශ වීම,

(ii) යම් සන්නිවේදන ජාලයක් අකර්මණ්‍ය වීම, තුන්වන පාර්ශ්වයේ යම් සේවා සැපයුම්කරුවන් විසින් කරනු ලබන ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, උපකරණයේ කාර්මික දෝෂයක්, විදුලි බල ඇණ හිටීමක්, ක්‍රමවත්ව ක්‍රියා නොකිරීමක්, බිඳවැටීමක් හෝ ප්‍රමාණවත් නොවන බවක්, සවිකිරීම හෝ පහසුකම් හෝ (නීති බලය ඇතිව හෝ නොමැතිව) යම් නීති, රීති, නියෝග, සංග්‍රහ, විධාන, නියාමන මාර්ගෝපදේශ හෝ රජයේ මඟ පෙන්වීම් ඇතුළුව එහෙත් ඊටම සීමා නොවූ, බැංකුවේ සාධාරණ පාලනයෙන් තොර වූ යම් ක්‍රියාවන්, නොකර හැරීම හෝ අවස්ථානුගත කරුණු හේතුවෙන් ඇතිවන ජංගම බැංකු සේවා සැපයීමේ දී, එම සේවාට අදාළව උපදෙස් හෝ තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ දී හෝ අන්තර්ජාල අඩවිය (අඩවි) සම්බන්ධයෙන් සිදුවන යම් දැනුවත් කිරීමක්, අන්තර් නිරෝධනයක්, අත්හිටුවීමක්, ප්‍රමාදයක්, අහිමිවීමක්, නොපැවතීමත්, විකෘති වීමක් හෝ වෙනත් අපොහොසත් වීමක්, සහ

(iii) ගනුදෙනුකරුට, ජංගම බැංකු සේවා භාවිත කිරීමට අදාළව ගනුදෙනුකරු විසින් මෙහෙයවනු ලබන සේවාවලට සහ/හෝ ගනුදෙනුවලට හෝ කටයුතුවලට අදාළ යම් තොරතුරු සහ/හෝ

ගනුදෙනු යම් සන්නිවේදන ජාල සැපයුම්කරුවකුගේ යම් පද්ධතියක්, උපකරණයක් හෝ සාධන පත්‍රයක් හරහා හෝ එවැන්නක් තුළින් සම්ප්‍රේෂණය කිරීම සහ/හෝ ගබඩා කිරීම,

මගින් හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන ප්‍රතිවිපාක සඳහා බැංකුව හෝ එහි සේවා නියුක්තයන් ගනුදෙනුකරු වෙත කිසිදු වගකීමකට හෝ බැඳීමකට යටත් නොවන්නේ ය.

9. ගනුදෙනුකරුගේ වගකීම්

9.1 ගනුදෙනුකරු විසින් හෝ බලය පැවරී ඇති හෝ නොමැති වෙනත් යම් තැනැත්තකු විසින් ජංගම බැංකු සේවා වෙත ලියාපදිංචි වීම, ප්‍රවේශ වීම සහ භාවිත කිරීම සහ/හෝ එකී භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යම් තොරතුරු හෝ වාර්තා හෝ වෙනත් යම් තොරතුරු පරිශීලනය කිරීම මගින් හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන සියලු ප්‍රතිවිපාක සඳහා ගනුදෙනුකරු පූර්ණ වශයෙන්ම වගකීමට යටත් වන සහ වගකිව යුතු වන අතර සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් හෝ සේවා නියුක්තයන් අතරින් යම් අයෙකු විසින් දරනු ලැබිය හැකි කවර හෝ ආකාරයක සියලු වගකීම්, හිමිකම් පෑම්, ඉල්ලීම්, පාඩු, හානි, මුදල්, ගාස්තු සහ වියදම් සම්බන්ධයෙන් ද, ඒ සම්බන්ධව සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් අතරින් යම් අයකු විසින් හෝ යම් අයකුට එරෙහිව පවරනු ලැබිය හැකි සියලු නඩු හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් ද ගනුදෙනුකරු විසින් එකී සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් හානිපූරණය කළ යුතු ය.

9.2 3.6 වගන්තියට යටත්ව, බැංකුවේ හෝ එහි සේවා නියුක්තයන්ගේ බරපතළ නොසැලකිල්ල හෝ හිතාමතාම පැහැර හැරීම හේතුවෙන් අතපසු වීමෙන් කරන ලද හෝ වැරදි ලෙස යොමු කරන ලද ගෙවීමක ප්‍රතිඵලයක් ලෙස ජංගම බැංකු සේවා භාවිතයෙන් සිදු කරන ලද අනවසර ගනුදෙනු හේතුවෙන් සිදුවන මුදල් පාඩුවක් හෝ අස්ථානගත වීමක් සඳහා ගනුදෙනුකරු වගකිවයුතු නොවන්නේ ය.

9.3 බැංකුවේ හෝ එහි සේවා නියුක්තයන්ගේ පාර්ශ්වයෙන් කිසිදු බරපතල නොසැලකිල්ලක් වංචාවක් හෝ හිතාමතාම පැහැර හැරීමක් සිදුව නොමැති අවස්ථාවක දී, ජංගම බැංකු සේවා සැපයීම, හෝ ඒ යටතේ සපයන ලද යම් තොරතුරු හෝ වාර්තාවක්/වාර්තා සම්බන්ධයෙන් හෝ මෙම නියම යටතේ බැංකුවේ බලතල සහ අයිතීන් ක්‍රියාත්මක කිරීමේදී හෝ ආරක්ෂා කිරීමේදී, බැංකුව, එහි සේවා නියුක්තයන් හෝ සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් විසින් දරනු ලැබිය හැකි කවර හෝ ආකාරයක සියලු වගකීම්, හිමිකම් පෑම්, පාඩු, හානි, මුදල්, ගාස්තු සහ වියදම් සම්බන්ධයෙන්ද ඔවුන්ගෙන් යම් අයකු විසින් හෝ යම්

අයකුට එරෙහිව පවරනු ලබන සියලු නඩු හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් ද ගනුදෙනුකරු විසින් එකී බැංකුව, එහි සේවා නියුක්තයන් හෝ සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් හානිපූරණය කළ යුතු ය.

9.4 යම් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් තුළ භාවිත කරනු ලබන පොදු පරිශීලක අනන්‍යතාවයන් (User ID) සහ මුරපද, එනම්, උදාහරණයක් ලෙස පුද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයන්, සමාජ ජාලා ආදිය, යොදා ගනිමින් ජංගම බැංකු සේවාව භාවිත කිරීම හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ගනුදෙනුකරු පූර්ණ වශයෙන්ම දැනුවත්ව සිටින බවටත් එවැනි අවස්ථාවන් වැළැක්වීම සඳහා නිසි පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග ගනු ලබන බවටත් යම් පරිශීලක අනන්‍යතා (User ID)/මුරපද සොරකම් කිරීම් සම්බන්ධයෙන් බැංකුව වගකීමට යටත් නොකරන බවටත් ගනුදෙනුකරු විසින් එකඟව සිට පිළිගනු ලැබේ.

10. නියම හා කොන්දේසි වෙනස් කිරීම

10.1 මෙම නියම හා කොන්දේසි වලින් කිසිවක්, ගනුදෙනුකරුට දැන්වීමක් ලබාදී ස්වකීය පරම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක සංශෝධනය කිරීමට, ඒවාට යමක් එකතු කිරීමට හෝ වෙනස් කිරීමට බැංකුව හිමිකම් ලබන අතර එම සංශෝධනය, එකතු කිරීම හෝ වෙනස් කිරීම මගින් ගනුදෙනුකරු බැඳී සිටිය යුතු ය. නියම හා කොන්දේසිවල යාවත්කාලීන කරන ලද අනුවාදය බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි වන්නේ ය.

10.2 ජංගම බැංකු සේවාව භාවිත කිරීම සමඟ සම්බන්ධිත වරප්‍රසාද බැංකුව විසින් නිශ්චය කළ යුතු අතර, කලින් කලට බැංකුව විසින් යෝග්‍ය යයි සලකනු ලබන පරිදි, ඒ සමග සම්බන්ධිත මෙම වරප්‍රසාද සහ කොන්දේසි වෙනස් කිරීමට, මද වශයෙන් වෙනස් කිරීමට, ඒවාට යමක් එකතු කිරීමට හෝ සංශෝධනය කිරීමට බැංකුවට පරම අභිමතය තිබිය යුතුය.

10.3 ජංගම බැංකු සේවාව, බැංකුවේ සාංගමික සංස්ථාපත්‍රය සහ ව්‍යවස්ථාවලිය, රීති සහ නියෝග සහ ජංගම බැංකු සේවාව මගින් ආවරණය කරනු ලබන සියලු සේවා, පහසුකම් සහ ගනුදෙනු පාලනය කරන්නා වූ යම් නියම හා කොන්දේසි වලට යටත් විය යුතු ය.

11. අවසන් කිරීම

11.1 ජංගම බැංකු සේවාව භාවිතය අවසන් කිරීමට ගනුදෙනුකරු තීරණය කරන අවස්ථාවක, ගනුදෙනුකරු විසින් 0094 112 448888 යන දුරකථන අංකය ඔස්සේ බැංකුවේ පැය 24 පුරා

ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය වෙත ඇමතුමක් ලබා දිය යුතු ය. බැංකුව විසින්, ස්වකීය පරම අභිමතය පරිදි, ගනුදෙනුකරු වෙත පූර්ව දැන්වීමක් සිදු කිරීමෙන් පසුව හෝ එසේ නොකර ජංගම බැංකු සේවාව අවලංගු කිරීම, ඉවත් කිරීම හෝ අලුත් කිරීම සිදු කළ යුතු ය.

11.2 පහත දැක්වෙන අවස්ථාවක දී, ගනුදෙනුකරුගේ පරිශීලක අනන්‍යතාවය(User ID) අක්‍රීය කර ජංගම බැංකු සේවාව වෙතින් ගනුදෙනුකරුගේ ප්‍රොෆයිලය මකා දැමීමට බැංකුව වෙත අයිතිය ඇති බව ගනුදෙනුකරු විසින් අවබෝධ කරගෙන සිටිනු ලැබේ;

(i) බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුව අඛණ්ඩ කාලසීමාවක් සඳහා ජංගම බැංකු සේවාව භාවිත කර නොමැති අවස්ථාවක දී.

12. පාලනය වන්නා වූ නීතිය සහ අධිකරණ බලය

12.1 සේවාවන් සහ මෙම නියම හා කොන්දේසි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති මගින් පාලනය විය යුතු අතර එම නීති ප්‍රකාරව තේරුම් ගනු ලැබිය යුතු ය.

12.2 මෙම ගිවිසුමට අනුව උපචිත වන නඩුකටයුතු බැංකුව සහ ගනුදෙනුකරු විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධිකරණවල අනන්‍ය අධිකරණ බලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

13. පැමිණිලි

13.1 ජංගම බැංකු සේවාව භාවිත කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරුට යම් පැමිණිල්ලක් හෝ විමසීමක් කිරීමට ඇති අවස්ථාවක දී, ගනුදෙනුකරු විසින් 0094 112 448888 දුරකථන අංකය ඔස්සේ බැංකුවේ පැය 24ම ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීම හෝ බැංකුවේ ශාඛාවක් වෙත පැමිණීම සිදුකළ යුතු ය.

13.2 ගනුදෙනුවල සිදුව ඇති යම් දෝෂයක්, විෂමතාවක් හෝ නොකර හැරීමක් පිළිබඳ ගනුදෙනුකරු දැනගන්නා අවස්ථාවක, ප්‍රකාශයේ දින සිට දින 14 ක් ඇතුළත ගනුදෙනුකරු විසින් ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දිය යුතුය.

14. NEOS PAY පහසුකම

14.1 NEOS Pay පහසුකම භාවිතයෙන් ජංගම බැංකු සේවාව හරහා සිදුකරනු ලබන ගනුදෙනු සඳහා බැංකුව වගකියනු නොලබන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිය යුතු ය.

14.2 ගනුදෙනුකරු විසින් NEOS Pay පහසුකම සඳහා ලියාපදිංචි කරන්නා වූ වෙනත් මූල්‍ය ආයතනවල පවත්වාගෙන යනු ලබන එක් එක් ගිණුම සඳහා ඔහු/ඇය විසින් කෙටි පණිවුඩ සේවා පහසුකමක් සඳහා ලියාපදිංචි වී ඇති බව ඔහු/ඇය විසින් සහතික කරගත යුතු ය.

14.3 වෙළෙන්දන් විසින් සපයනු ලබන QR කේතය මගින් ලැබෙන තොරතුරුවල නිරවද්‍යතාව සම්බන්ධයෙන් බැංකුවට කිසිදු බැඳීමක් හෝ වගකීමක් නොමැති බවට ගනුදෙනුකරු විසින් තවදුරටත් එකඟව පිළිගනු ලැබේ.

14.4 අදාළ මූල්‍ය ආයතනයේ ලියාපදිංචි කර ඇති ජංගම දුරකථන අංකය වෙත උත්පාදනය කර යවනු ලබන අහඹු සංඛ්‍යාව වෙනත් කිසිදු තුන්වන පාර්ශවයන් වෙත ලබා දීමෙන් තොරව ආරක්ෂිතව සහ සුරක්ෂිතව තබා ගැනීම සඳහා ගනුදෙනුකරු විසින් පූර්වාරක්ෂක පියවර ගනු ලැබිය යුතු ය.

14.5 NEOS Pay පහසුකමට අදාළ යම් පැමිණිලි පහත 13 වන වගන්තියේ විස්තරාත්මකව දක්වා ඇති පැමිණිලි කාර්ය පටිපාටියට අනුව හසුරුවනු ලැබිය යුතු බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

ගනුදෙනුකරු ඉහත සඳහන් කරුණු කියවා අවබෝධ කරගෙන ඇති බව ගනුදෙනුකරු විසින් මෙයින් සහතික කර ඊට එකඟව සිටිනු ලබන අතර ජංගම බැංකු සේවාව භාවිතය හේතුවෙන් හටගන්නා ගාස්තු ඇතුළුව ඉහත නියම හා කොන්දේසි මගින් බැඳී සිටීමට මෙයින් එකඟව සිටිනු ලැබේ.